# කැලණිය විශ්වවිද්‍යාලය

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා අයදුම් කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පාඨමාලාව සඳහා නව විෂය නිර්දේශය යටතේ නවක විද්‍යාර්ථීන් සඳහා 2022 පෙබරවාරි 21 දින සිට පහත සඳහන් කර ඇති වෙබ් අඩවිය මගින් මාර්ගගත ක්‍රමය (online) ඔස්සේ අයදුම්පත් කැඳවනු ලැබූ අතර , එම දැන්වීමෙහි සඳහන් පරිදි අයදුම්පත් කැඳවන අවසාන දිනය 2022 මාර්තු 21 යන්න **2022 අප්‍රේල් 08 දින දක්වා දීර්ඝ කර ඇති බව කරුණාවෙන් සලකන්න.**

**www.cdce.kln.ac.lk**

**මේ සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ට අයදුම් කළ හැකිය.**

01. 2018 හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස උ.පෙළ සමත් අපේක්ෂකයින්
02. ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශය (SLQF) දෙවන මට්ටම සම්පූර්ණ කොට ඇති අපේක්ෂකයින්
03. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)5 හෝ ඉහළ සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්
04. කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කර ඇති වෙනත් සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්.

**අයදුම්පත් කැඳවන අවසාන දිනය 2022 අප්‍රේල් 08.**

පාඨමාලා ගාස්තුව රු. 86,000.00කි. (මෙය වාරික 05කින් ගෙවීම් කළ හැකිය.)

මේ සම්බන්ධව වැඩි විස්තර දැන ගැනීම සඳහා:

| | | |
|---|---|---|
| වෙබ් අඩවියට පිවිසෙන්න | - | **www.cdce.kln.ac.lk** |
| දු. අ. | - | 011-2987000, 011-2987001, 011-2987002, 011-2987005 |
| විද්‍යුත් ලිපිනය | - | **cdce@kln.ac.lk** |

**සටහන -** 2017 ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) සඳහා මීට පෙර අයදුම් කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම් කළයුතු අතර, මේ සඳහා අයදුම්පත් ගාස්තු ගෙවීමට අවශ්‍ය නැත.

**ලේඛකාධිකාරී,**
**කැලණිය විශ්වවිද්‍යාලය.**
**2022.03.14**